# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දෙල්තොට මහ්ෆලුල් උලමා අරාබි විදුහල
## (සංස්ථාගත කිරීමේ)

**දෙල්තොට මහ්ෆලුල් උලමා අරාබි විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. බී. ෆාරුක් මහතා විසින් 2013 අප්‍රේල් මස 10 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 ජනවාරි මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[234 වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007177—750 (2013/04)

# දෙල්තොට මහ්ෆලුල් උලමා අරාබි විදුහල (සංස්ථාගත කිරීමේ)

## දෙල්තොට මහ්ෆලුල් උලමා අරාබි විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

“දෙල්තොට මහ්ෆලුල් උලමා අරාබි විදුහල” යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන අරාබි විදුහලක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී අරාබි විදුහල සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී අරාබි විදුහල පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී අරාබි විදුහල විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින්ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2013 අංක දරන දෙල්තොට මහ්ෆලුල් උලමා අරාබි විදුහල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

දෙල්තොට මහ්ෆලුල් උලමා අරාබි විදුහල සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “අරාබි විදුහල” යනුවෙන් සඳහන් කරනු ලබන) දෙල්තොට මහ්ෆලුල් උලමා අරාබි විදුහලේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරණු ලබන තැනැත්තන්, (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “දෙල්තොට මහ්ෆලුල් උලමා අරාබි විදුහල” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින්ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

2—PL 007177—75 (2012/12)

(අ) ඉස්ලාමීය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සහ පුහුණු කිරීම සඳහා සැලසීම;

(ආ) ශුද්ධ වූ කුරානය මතකයේ තබා ගැනීම සඳහා ශිෂ්‍යයන් පුහුණු කිරීමේ පන්ති පැවැත්වීම;

(ඇ) ඉස්ලාමීය ආගම පිළිබඳ පොත් සහ සඟරා පළ කිරීම;

(ඈ) අරාබි භාෂාව සමඟ ඉස්ලාමීය අධ්‍යයන පාඨමාලා හා අනෙකුත් දැනුම් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සමස්ථ දැනුම ලබා දී දැනුමින් පූර්ණ පෞරුෂයෙන් යුත් අධ්‍යාපනඥයින් බිහි කිරීම;

(ඉ) උසස් අධ්‍යාපනයේ සංවර්ධනය අරමුණු කරගෙන දේශීය හා විදේශීය රටවල ඇති ජාත්‍යන්තර මට්ටමේ උසස් අධ්‍යාපන ආයතන අතර සම්බන්ධතා ඇති කිරීම;

(ඊ) පාසලේ අරමුණු ඉටුකර ගැනීමට ප්‍රතිලාභ අත්කර ගැනීමට සම්මන්ත්‍රණ, දේශන, වැඩමුළු යන වෙනත් ක්‍රියාකාරකම් මධ්‍ය ආයතනය මගින් ක්‍රියාත්මක කිරීමට අනුබල දීම;

(උ) නව අභියෝගවලට මුහුණ දීම සඳහා නව තාක්ෂණය හා අනෙක් ක්ෂේත්‍ර පිළිබඳ කාලීන අධ්‍යාපනයක් ලබා දී සිසුන් එයට සූදානම් කිරීම;

(ඌ) විදුහලේ අරමුණු ජාතික මට්ටමින් පුළුල් කිරීමට කටයුතු කිරීම;

(එ) විශේෂයෙන් ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව අතර සහ ශ්‍රී ලංකාවේ ජීවත් වන වෙනත් සියලු ප්‍රජාවන් අතර එකමුතුකම සහ සහෝදරත්වය පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම;

(ඒ) මෙම විදුහලට අනුබද්ධිත ආයතන වශයෙන් කාන්තාවන් සඳහා කුරාන් ශිෆුල් අංශය, අනාථ නිවාස, ඉස්ලාමීය මාර්ගෝපදේශන ආයතන හා කාර්මික අධ්‍යාපන ආයතන යනාදිය ඇති කිරීමට ව්‍යාපෘති සකස් කිරීම; සහ

(ඔ) ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවල විධිවිධාන සලස්වා තිබෙන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින් මතු “සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ භාරකාර සභාවේ සාමාජිකයන් වශයෙන් ධූර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) අරමුදල් රැස්කිරීම සහ දේශීය හෝ විදේශීය කවර හෝ ප්‍රභවයකින් මුදලින් හෝ ද්‍රව්‍යකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීමට;

(ආ) චංචල හෝ නිශ්චල දේපල කවර හෝ ආකාරයකින් අත් කරගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදි කිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු

කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් කළමනාකරණ සභාව තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) මේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට ඇතුළත් වීම; සහ

(ඊ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාම;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, සභාවේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත් හැරීම සහ සභාවේ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම කැඳවීම සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය;

(ඉ) සංස්ථාවේ හා සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සංස්ථාවේ දේපල පරිපාලනය හා කළමනාකරණය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ලද ආකාරයට ම එවැනි ම රැස්වීමක දී කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද රීතිවලට සෑම විට ම සංස්ථාවේ සාමාජිකයන් යටත් විය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක වූ පදනමේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට, මේ වගන්තිය යටතේ සෑදූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම් හා විගණනය.

7. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සභාව තීරණය කරන පදිරි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා", යන්නෙන්,—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන්

වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාව ලාබ නොලබන සංවිධානයක් විය යුතු බව.

8. කවර ප්‍රභවයකින් ව්‍යුත්පන්න වුව ද සංස්ථාවේ මුදල් සහ දේපල හුදෙක්ම මෙහි සඳහන් කර ඇති සංස්ථාවේ පරමාර්ථ නංවාලීම උදෙසා යොදා ගත යුතු අතර, ඉන් කිසිම කොටසක්, සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ණය, ප්‍රසාද මුදල් හෝ වෙනත් කවර වූ ද ආකාරයට ලාභ වශයෙන් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය:

එසේ වුවද මේ වගන්තියේ විධිවිධාන මගින්:—

(අ) සංස්ථාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සද්භාවයෙන් මේ සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ඔහුට ගෙවීම;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් සමාගමක කොටස්කරුවකු වන අවස්ථාවක ඒ සමාගම විසින්, සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරණ නිසි කුලියක් ගෙවීම; සහ

(ඇ) තම කටයුතු හෝ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙහි ලා සංස්ථාවේ යම් සාමාජිකයකු නිලධරයකු හෝ සේවකයකු විසින් කළමනාකරණ මණ්ඩලයෙන් කලින් ලබා ගන්නා ලද අනුමැතිය ඇතිව දරන ලද යුක්තිසහගත හා නිසි වියදම් ආපසු ගෙවීම හෝ පියවීම.

**සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.**

**9.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට නොවිය යුතු ය.

**විදුහල විසින් සහ විදුහලට ගෙවිය යුතු මුදල්.**

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි විදුහලේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට විදුහලට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.**

**11.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**12.** ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**සාමාජික නාම ලේඛනය.**

**13.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කමිටුවේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන යෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කළ යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු කළ යුතු ය.

(2) ලේඛනයේ පහත සඳහන් විස්තර ඇතුළත් විය යුතු ය:—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය සහ රැකියාව;

(ආ) යම් සාමාජිකයකුගේ නම ලේඛනයේ සටහන් කරනු ලැබූ දිනය; සහ

(ඇ) යම් තැනැත්තකු සාමාජිකයකු වී සිටීම අවසන් වූ දිනය.

*විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.*

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

*ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**15.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

*සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා වගකීමෙන් නිදහස් කිරීම.*

**16.** මේ පනතින් හෝ ඒ යටතේ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.